ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක 2019 ජූලි 24

# ප්‍රවෘත්ති නිවේදනය

## ආහාර ශේෂ පත්‍රය 2013-2017

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයුම් අමාත්‍යාංශය

**දුරකථන: 011-2147464** **ෆැක්ස් : 011-2147463**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂයක් සඳහාම ආහාර ශේෂ පත්‍රය සකස් කිරීම සිදු කරනු ලබන අතර මෙවර එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය මගින් හඳුන්වා දෙනු ලැබූ වැඩිදියුණු කරන ලද ක්‍රමවේදයන් භාවිතා කරමින් 2013 සිට 2017 වර්ෂ දක්වා ආහාර ශේෂ පත්‍රයන් සකස් කරන ලදී.

ආහාර ශේෂ පත්‍රයක් යනුවෙන් හඳුන්වනු ලබන්නේ රටක නිශ්චිත වර්ෂයක් සඳහා පවතින මුළු ආහාර සැපයුම කොපමණද යන්න ගණනය කර දක්වන ලේඛනයකි. මෙහිදී රටක මුළු ආහාර සැපයුම සකස් වනුයේ රට තුළ නිෂ්පාදනය කරන ආහාර ප්‍රමාණයට ආනයනය කරන ලද ආහාර ප්‍රමාණයන් එකතු කර එයට වර්ෂ ආරම්භයේ ඇති තොග ගැලපීමෙනි. එම මුළු ආහාර සැපයුම, ආහාර (මිනිස් පරිභෝජනය), අපනයන, සත්ත්ව ආහාර, බීජ , ආහාර පිණිස නොවන අනෙකුත් නිෂ්පාදන (Industrial Uses) සහ හානිවීම් සඳහා භාවිතා කරනු ලබයි.

(නිෂ්පාදනය + ආනයන -තොග වෙනස්වීම් = ආහාර (මිනිස් පරිභෝජන) + අපනයන + සත්ත්ව ආහාර + බීජ + ආහාර නොවන අනෙකුත් නිෂ්පාදන + හානිවීම්)

එම ආහාර ශේෂ පත්‍රයන්ට අනුව 2013 සිට 2017 වන වර්ෂයන් සඳහා සාමාන්‍ය අගයන් (Average) සළකා බැලීමේදී ශ්‍රී ලංකාවේ පුද්ගලයෙක් සඳහා දිනකට කිලෝ කැලරි 2883 ද ප්‍රෝටීන් ග්‍රෑම් 72 ක් සහ මේද ග්‍රෑම් 52 ලෙස ලැබිය හැකිය.තවද කැලරි සැපයුමෙන් 93% ක් ශාකමය ආහාර වන අතර ඉතිරිය සත්ත්වමය ආහාර වලින් ලබාදේ. ප්‍රෝටීන් සැපයුමෙන් 48% ක් ධාන්‍යමය ආහාර වර්ග වලින් ද මාළු වලින් 12% ක් ද මාංශ භෝග 11% ද එළවළු, කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ මස් ආශ්‍රිත නිෂ්පාදන පිළිවෙලින් 7%, 6% ක් සහ 5% ක් ලෙස ද මේද සැපයුමෙන් 32% ක් එළවළු තෙල් වලින් ද 31% මේද සහිත බෝග (Oil Crop) වලින්ද සැපයෙන බව ද ගණනය කර ඇත.

එසේම එක් පුද්ගලයෙකුට වර්ෂයක් සඳහා සාමාන්‍ය සැපයුම සහල් කිලෝ ග්‍රෑම් 169 ක් ද, එළවළු කිලෝ ග්‍රෑම් 132 ක් පළතුරු කිලෝ ග්‍රෑම් 42 ක් සහ කිරි, මාළු, මස්, බිත්තර පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 34, 32, 10 සහ 5 ක් බව මෙමගින් අනාවරණය වේ.

ආහාර ශේෂ පත්‍රය පිළිබඳ සියළුම තොරතුරු ඇතුළත් වාර්තාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් පිටුව, www.statistics.gov.lk ට පිවිසීමෙන් ලබා ගත හැක.

අයි.ආර්.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංකය 011-2147020